සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.
ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES UNION

අංක 68 ,
දෙහිදෙනිය
පේරාදෙනිය

ලි.ප. අංකය 7570

2020.04.15

සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරය/සහෝදරිය ,

<u>සමෘද්ධි නිළදරු ණය යෝජනා ක්‍රමය.</u>

මෙම කාල වකවානුව තුල ඔබ සියලුදෙනා රට වෙනුවෙන් රටේ ජනතාව වෙනුවෙන් ඔබගේ පවුලේ සුභ සිද්ධිය හා ඔබගේ සෞඛ්‍ය තත්වයන් පිළිබඳව පවා නොසිතා පැය 24 පුරාවට සිදුකරණු ලැබූ සහ ඉදිරියට සිදුකරණු ලබන සේවය වෙනුවෙන් පළමුවෙන්ම සහෝදර,සහෝදරියන් සියලු දෙනාට සංගමයේ හෘදයාංගමය ස්තුතිය පුදකර සිටිමු.

රටේ උද්ගතව ඇති නව කොරෝනා වෛරස් වසන්ගතයෙන් ජනතාව මුදාගැනීම සඳහා පවත්නා රජය වැඩසටහන් රාශියක් සිදුකරගෙනයන බව ඔබ අප දන්නා කරුණකි.ප්‍රධාන වශයෙන්ම මෙම වෛරස් තත්වය පාලනය කිරීම සඳහා ක්‍රියාත්මකව ඇති ඇඳිරි නීතිය හමුවේ සමෘද්ධි වැඩසටහනට සම්බන්ද අඩු ආදම්ලාභීන් මෙන්ම ඒදිනෙදා ජීවනෝපාය සරිකරගත් විශාල පිරිසක් ආර්ථික අපහසුතාවයන්ට ලක්ව ඇත.මෙසේ අසරණ තත්වයට පත් ජනතාවට සේවය සැපයීම සඳහා සමෘද්ධි වැඩසටහන හා ඒහි සේවය කරණ සමස්ථ නිළධාරී කණ්ඩායම සුදුසුම කණ්ඩායම බවට අතිගරු ජනාධිපති තුමන් තීරණය කර ඇත.එය අපගේ සේවාවට ලබාදුන් ගෞරවයක් බවත් ඉදිරියේදී අපට මෙය ශක්තියක් බවත් මෙයින් ඔබට දන්වා සිටිමි.

අතිගරු ජනාධිපති තුමන්ගේ උපදෙස් පරිදි ජීවනෝපාය අහිමිවී සිටින සියලුම ජන කොටස් සඳහා ලබාදෙන රු 5000/= ක දීමනාව සමෘද්ධි බැංකු පද්ධතිය සතු අරමුදල් යොදාගෙන ක්‍රියාත්මක කරණ බව නොරහසකි.පසුගිය කාල වකවානුව තුල මෙම බැංකු පද්ධතිය සතු මුදල් භාවිතා කිරීමට යාමේදී අප සංගමයක් වශයෙන් ඒ පිළිබඳව සොයා බැලූ අතර ඒම මුදල් ආරක්ෂා කර ගැනීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කළ බවද නොරහසකි.මෙම අවස්ථාවේදී ද අප සංගමයක් වශයෙන් කටයුතු කළ බව ද ප්‍රකාශ කර සිටිමි.මෙම සියලුම මුදල් ඉදිරි අයවැය තුලින් ප්‍රතිපූරණය කිරීමට මහ බැංකුව ලිඛිතව දැනුම් දී ඇත.

කරුණු එසේ වුවත් මුලු රටක් තම අවධානය එක් පැත්තකට යොමුකර වැඩකටයුතු සිදුකරමින් සිටින අවස්ථාවක අප සංගමයද ඒ පිළිබඳව දැඩි අවධානයකින් කටයුතු

සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු.අං..071-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු.අං.071- 4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු.අං.071-8191473